පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
10

# දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ................................................
..........................................................................................

කාලය : පැය 03 යි.

# පුරවැසි අධ්‍යාපනය I, II

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි :**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

Education NCP - www.edncp.lk

01. ජනතාවට පාලන කටයුතුවලට සහභාගි වීමට ඉඩ සැලසෙන පාලන ක්‍රමය දැක්වෙන පිළිතුර වනුයේ,
(1) ඒකාධිපති ආණ්ඩු ක්‍රමය (2) රාජාණ්ඩු ආණ්ඩු ක්‍රමය
(3) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය (4) වැඩවසම් ආණ්ඩු ක්‍රමය

02. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කරගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු කාර්යභාරය **නොවන්නේ,**
(1) ආණ්ඩු පක්ෂය විසින් ඉටු කරනු ලබන යහපත් කටයුතු සාර්ථක කරගැනීමට සහයෝගය ලබාදීම
(2) සංවර්ධනාත්මක විවේචන තුළින් ආණ්ඩුව සුමගට ගැනීම
(3) ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්ති වලට හා ක්‍රියාවන්ට විරුද්ධත්වය දැක්වීම
(4) ආණ්ඩුවේ සෑම කටයුත්තක්ම විවේචනය කිරීම

03. "බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කරගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිදහසයි." නිදහස පිළිබඳව මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,
(1) මහාචාර්ය ගානර් (2) ඇරිස්ටෝටල්
(3) ජී. ඩී. එල්. කෙවිල් (4) සීලර්

04. ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සිදු කරන්නේ,
(1) පළාත් පාලන හා පළාත් සභා ඇමතිතුමා විසින් ය.
(2) මැතිවරණ කොමිෂන් සභාව විසිනි.
(3) මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාව විසිනි.
(4) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි.

05. ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායය වන්නේ,
(1) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව
(2) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා රාජ්‍ය මන්ත්‍රණ සභාව
(3) ජාතික සභාව හා සෙනෙට් සභාව
(4) ව්‍යවස්ථාදායක සභාව හා කොංග්‍රස් මණ්ඩලය

06. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කරන ලද්දේ,
(1) 1948 දෙසැම්බර් 01 (2) 1948 දෙසැම්බර් 23
(3) 1948 දෙසැම්බර් 16 (4) 1948 දෙසැම්බර් 10

07. නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණයක් **නොවන්නේ**,
(1) සැමොම නීතියට ගරු කිරීම අවනත වීම හා නීතිය අභිබවා නොයාම
(2) නීතියේ රැකවරණය සියල්ලටම සර්ව සාධාරණව ලැබීම
(3) අධිකරණ ක්ෂේත්‍රයේ උසස් නිළධාරීන්ට නීතියෙන් විශේෂ වරප්‍රසාද හිමි වීම
(4) පවත්නා නීතිය යටතේ වරදකරුවන්ට දඬුවම් පැමිණ වීම

08. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ රාජ්‍යයේ පාලනය සිදුවන්නේ,
(1) රජුගේ පරම්පරාගත තීරණවලට අනුවය.
(2) සාම්ප්‍රදායික චාරිත්‍ර විධිවලට අනුව ය.
(3) පොදු පිළිගැනීම් මාලාවක් මත පිහිටා කටයුතු කිරීමෙන් ය.
(4) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව ය.

09. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල ක්‍රියාවට නැන්වීම පිළිබඳ ගැටළු මතු වුවහොත් එය විසඳීම සිදු කරන්නේ,
(1) ෆෙඩරල් අධිකරණය මඟිනි. (2) ශ්‍රේෂ්ඨාධිකරණය මඟිනි.
(3) අභියාචනාධිකරණය මඟිනි. (4) සංඝීය මහා මණ්ඩලය මඟිනි.

10. ඒකීය රාජ්‍යයක් වන්නේ පහත සඳහන් රටවලින් කවර රටක ද?
(1) ඉන්දියාව (2) ස්විට්සර්ලන්තය
(3) ශ්‍රී ලංකාව (4) ඇමරිකා එක්සත් ජනපදය

11. සංඝීය රාජ්‍යයක ප්‍රාදේශීය ආණ්ඩු,
(1) ෆෙඩරල් ආණ්ඩු ලෙස හඳුන්වයි. (2) ප්‍රාන්ත ආණ්ඩු ලෙස හඳුන්වයි.
(3) පළාත් ආණ්ඩු ලෙස හඳුන්වයි. (4) රාජාණ්ඩු ලෙස හඳුන්වයි.

12. අනුරාධපුර යුගය තුළ පණ්ඩුකාභය රජු විසින් ගම් පාලනය කිරීම සඳහා පත් කළ නිළධාරියෙකු වන්නේ,
(1) ගාමණී (2) ග්‍රාම නිළධාරී
(3) නගර ගුත්තික (4) ග්‍රාමෝධය නිළධාරී

13. පාලන කටයුතු සඳහා රෙසිඩන්ට්වරයෙකු පත් කළේ,
(1) බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ (2) පෘතුගීසි පාලන කාලය තුළ
(3) ලන්දේසි පාලන කාලය තුළ (4) 1948 නිදහස ලැබීමෙන් පසු

Education NCP - www.edncp.lk

14. මහනගර සභා ආඥා පනත සම්මත කරන ලද්දේ,

(1) 1865 (2) 1868 (3) 1864 (4) 1817

15. බලය විමධ්‍යගත කිරීම සඳහා දේශපාලන අධිකාරී ක්‍රමය ස්ථාපිත කරන ලද්දේ,

(1) 1977 (2) 1978 (3) 1973 (4) 1970

16. පළාත් සභාවක නිළ කාලය සඳහන් නිවැරදි පිළිතුර වන්නේ වසර,

(1) 5 (2) 6 (3) 4 (4) 8

17. වයඹ පළාතට අයත් දිස්ත්‍රික්ක වන්නේ,

(1) අනුරාධපුරය, කුරුණෑගල (2) කොළඹ, කළුතර

(3) මාතලේ, පුත්තලම (4) පුත්තලම, කුරුණෑගල

18. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව පළාත් සභා ලැයිස්තුවේ සඳහන් බලතල හා කාර්යය සංඛ්‍යාව වන්නේ,

(1) 37 කි. (2) 34 කි. (3) 39 කි. (4) 36 කි.

19. ප්‍රාදේශීය සභා පිහිටුවන ලද්දේ,

(1) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුව ය.

(2) 1987 අංක 42 දරණ පාර්ලිමේන්තු සභා පනතට අනුව ය.

(3) 1978 අංක 13 දරණ පාර්ලිමේන්තු සභා පනතට අනුව ය.

(4) 1987 අංක 40 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුව ය.

20. පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය වන්නේ,

(1) මහ සභාව (2) විධායක සභාව

(3) පළාත් සභාව (4) රට සභාව

21. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත ආණ්ඩු සංඛ්‍යාව වන්නේ,

(1) 49 කි. (2) 39 කි. (3) 50 කි. (4) 20 කි.

22. ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක ගණන වනුයේ,

(1) 22 (2) 23 (3) 24 (4) 25

23. රටේ පරිපාලන කටයුතු පහසු කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන අතර කුඩාම ඒකකය වන්නේ,

(1) පළාත (2) දිස්ත්‍රික්කය

(3) ග්‍රාම නිළධාරි කොට්ඨාසය (4) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

24. ස්විට්සර්ලන්තයේ කැන්ටන් සතු බලතලයක් වන්නේ,

(1) විදේශ කටයුතු (2) මහාමාර්ග කටයුතු

(3) බැංකු කටයුතු (4) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන කටයුතු

Education NCP - www.edncp.lk

25. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් සැලකෙන යහපතක් **නොවන්නේ,**

(1) ජාතික සමගිය හා යහජීවනය වර්ධනය වීම.

(2) ගැටළු අවම වීම.

(3) තම ජනවර්ගයට සැලකිලි දැක්වීමට හැකි වීම.

(4) එක් ජාතියක් සඳහා එක් රටක් යන හැඟීම වර්ධනය වීම.

26. යුරෝපයේ මුලින්ම බිහිවූ ජාතික රාජ්‍යයන් දෙකකි.

(1) ස්විට්සර්ලන්තය, එංගලන්තය (2) ප්‍රංශය, ජර්මනිය

(3) ජර්මනිය, ඉතාලිය (4) එංගලන්තය, ප්‍රංශය

27. යම්කිසි රටක පරිපාලන කටයුතු පහසු කරගැනීමේ අරමුණින් මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම හඳුන්වනු ලබන්නේ,

(1) බලය විමධ්‍යගත කිරීම (2) බලය විහැන් කිරීම

(3) බලය බෙදාහැරීම යනුවෙනි. (4) බල තුලනය නමිනි.

28. සංකීර්ණ වූ බහු සංස්කෘතික රටකට හොඳම උදාහරණය,

(1) ඉන්දියාව (2) ලංකාව

(3) බංගලාදේශය (4) පකිස්ථානය

29. ජනවර්ගය අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සිංහල ජනගහනයේ ප්‍රතිශතය වන්නේ,

(1) 74.8 කි. (2) 74.9 කි. (3) 74.0 කි. (4) 74.2 කි.

30. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් වීම සඳහා බලපෑ ප්‍රධාන සාධකයකි සංක්‍රමණ. සංක්‍රමණ වලට ඇතුළත් නොවන පිළිතුර වන්නේ,

(1) විජය ඇතුළු පිරිසගේ පැමිණීම (2) පඬුවස් දෙව් ඇතුළු පිරිසගේ පැමිණීම

(3) මිහිඳු මහ රහතන් වහන්සේගේ පැමිණීම (4) සේන ගුත්තික ආක්‍රමණ

31. යහපාලනයක් මූලික ගුණාංග ඇතුළත් පිළිතුරක් **නොවන්නේ,**

(1) අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම (2) දූෂණයෙන් වංචාවෙන් තොර රාජ්‍ය පාලනය

(3) මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම (4) රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාව

32. රාජාණ්ඩු ක්‍රමය වෙනුවට පාලන කටයුතු සම්බන්ධයෙන් ජනතා නියෝජිතයින්ගේ බලය ඉස්මතු කරමින් පාර්ලිමේන්තු බලය වර්ධනයට තුඩු දුන් උත්කෘෂ්ඨ විප්ලවය ලෙස ගැනෙන ඓතිහාසික සිදුවීම වනුයේ,

(1) ඉංග්‍රීසි විප්ලවය (2) ප්‍රංශ විප්ලවය

(3) රුසියන් විප්ලවය (4) කියුබානු විප්ලවය

33. විධායකය සතු කාර්යයක් **නොවන්නේ,**

(1) නීති සම්පාදනය කිරීම (2) නීතිරීති ක්‍රියාත්මක කිරීම

(3) රාජ්‍ය ආරක්ෂක කාර්යය (4) රාජ්‍ය සේවය පාලනය

Education NCP - www.edncp.lk

34. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක විධායකයේ ප්‍රධානියා වන්නේ,

(1) කථානායකවරයා ය. (2) ජනාධිපතිවරයා ය.

(3) අගමැතිවරයා ය. (4) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය.

35. ඔහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් **නොවන්නේ,**

(1) අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම (2) තම හිත මිතුරන්ට වැඩි සැලකිල්ලක් දැක්වීම

(3) සාමූහිකත්වය වර්ධනය (4) සමානාත්මතාවය

36. ස්විට්සර්ලන්තයේ ව්‍යවස්ථාදායකය හඳුන්වන්නේ,

(1) සන්ධීය මහා මණ්ඩලය (2) කොංග්‍රස් මණ්ඩලය

(3) උත්තර මන්ත්‍රී මණ්ඩලය (4) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

37. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ජනාධිපති තෝරාගනු ලබන්නේ,

(1) ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීන්ගේ බහුතර ඡන්දයෙනි.

(2) ව්‍යවස්ථා මණ්ඩලයේ අනුමැතියෙනි.

(3) ජනාධිපතිවරණයකිනි.

(4) අධිකරණ සේවා කොමිෂම මඟිනි.

38. ජාතික රාජ්‍ය බිහිවීමට දේශපාලන චින්තකයින්ගේ අදහස් බලපෑවේ ය. එබඳු දේශපාලන චින්තකයෙන් **නොවන්නේ,**

(1) නිකොලායි මැකියාවෙලි (2) ජින් බොඩෑන්

(3) තෝමස් හොබ්ස් (4) ඒබ්‍රහම් ලින්කන්

39. "ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එක් වී පිහිටුවාගත් සංවිධානය රාජ්‍ය නම් වේ." මෙම ප්‍රකාශය කරන ලද්දේ,

(1) ඇරිස්ටෝටල් (2) ප්ලේටෝ

(3) මහාචාර්ය අයිවර් ජෙනින්ක් (4) මහාචාර්ය ගානර්

40. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියෙකු සතු ගුණාංගයක් **නොවන්නේ,**

(1) සාකච්ඡා මඟින් තීරණ වලට එළඹීම

(2) සහයෝගයෙන් කටයුතු කිරීම

(3) විරුද්ධ පාක්ෂිකයන්ට අදහස් දැක්වීමට ඉඩ නොදීම

(4) නීති ගරුක වීම

***

Education NCP - www.edncp.lk

## පුරවැසි අධ්‍යාපනය II

- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- ❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (i) ජනාධිපති ආණ්ඩු ක්‍රමයක විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) ඒක පක්ෂ ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න.

(iii) ග්‍රීසියේ ඇතැන්ස් නුවර පැවති පාලන ක්‍රමයේ පාලන කටයුතු වලට සහභාගී වීමට අවස්ථාව නොලැබූ කණ්ඩායම් දෙකක් ලියන්න.

(iv) නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් ලියන්න.

(v) නීතියේ ආධිපත්‍ය විදහාපාන ලක්ෂණ දෙකක් දක්වන්න.

(vi) එංගලන්තය, ප්‍රංශය වැනි රටවල් ප්‍රබල ජාතික රාජ්‍යයන් ලෙස නැගී සිටීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(vii) පුරවැසියන් සතු යුතුකම් ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් දෙක නම් කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ හා දිස්ත්‍රික්ක මට්ටමේ ප්‍රධාන පරිපාලන නිළධාරීන් දෙදෙනා නම් කරන්න.

(ix) පළාත් ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් දෙකක් ලියන්න.

(x) ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල එක බැගින් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

02. (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ස්වරූප දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සප්ත අපරිහානි ධර්ම තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදය, පාලන ක්‍රමයක් ලෙස වැදගත් වීමට හේතු තුනක් දක්වා, ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. (i) ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීමේ ප්‍රධාන නිර්නායක දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) වර්තමාන ලෝකයේ දැකිය හැකි පක්ෂ ක්‍රමයේ ස්වරූප තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ 03 ක් සඳහන් කර, ඉන් එකක් පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05)

04. (i) රාජ්‍යයක් සතු ස්වාධිපති බලය ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) රාජ්‍යයකට පැවරෙන ප්‍රධාන කාර්යයන් තුනක් සඳහන් කර, ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

Education NCP - www.edncp.lk

05. (i) ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩු ක්‍රම ව්‍යුහයේ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සන්ධීය රාජ්‍යයක ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) ඒකීය රාජ්‍ය හා ඒකීය ආණ්ඩුව යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. (i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් වීම කෙරෙහි බලපෑ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික සමාජය මූලික ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සංස්කෘතිය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. (i) ශ්‍රී ලංකාවේ වාසය කරන ජනවර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) වර්තමාන ජන සමාජයේ යහපාලන සංකල්පය බොහෝ විට සාකච්ඡාවට බඳුන් වී ඇත. යහපාලනයක අවශ්‍යතාවය මතුවීමට බලපාන හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) සමාජයක යහපැවැත්ම උදෙසා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් සඳහන් කර, ඉන් එකක් පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05)

***

Education NCP - www.edncp.lk

## පුරවැසි අධ්‍යාපනය I

## ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01 | (1) | 21 | (3) |
| 02 | (4) | 22 | (1) |
| 03 | (3) | 23 | (3) |
| 04 | (3) | 24 | (1) |
| 05 | (1) | 25 | (3) |
| 06 | (4) | 26 | (4) |
| 07 | (3) | 27 | (3) |
| 08 | (4) | 28 | (1) |
| 09 | (2) | 29 | (2) |
| 10 | (3) | 30 | (4) |
| 11 | (2) | 31 | (4) |
| 12 | (1) | 32 | (1) |
| 13 | (3) | 33 | (1) |
| 14 | (1) | 34 | (4) |
| 15 | (3) | 35 | (2) |
| 16 | (1) | 36 | (4) |
| 17 | (4) | 37 | (3) |
| 18 | (1) | 38 | (4) |
| 19 | (1) | 39 | (4) |
| 20 | (1) | 40 | (3) |

## පුරවැසි අධ්‍යාපනය II

## ලකුණු දීමේ පටිපාටිය

01. (i) ★ විධායක බලය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා විසින්ය.
★ රාජ්‍යයේ නායකයා මෙන්ම ආණ්ඩුවේ නායකයා වන්නේද ජනාධිපතිවරයාය.
★ විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුව බැඳී නැත.
★ ව්‍යවස්ථාදායකය මඟින් සෘජුවම විධායකය පාලනය කිරීමක් සිදු නොවේ. (පිටු අංක 15)

(ii) උතුරු කොරියාව, චීනය, කියුබාව (පිටු අංක 7)

(iii) නගර වැසි කාන්තාවන්ට, වහලුන්ට, විදේශිකයන්ට

(iv) මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය

(v) ★ සැවොම නීතියට ගරු කිරීම, අවනත වීම හා නීතිය අභිභවා නොයෑම.
★ පවත්නා නීතිය යටතේ වරදකරුවන්ට දඬුවම් පැමිණ වීම.
★ නීතියේ රැකවරණ සියල්ලක්ම සර්ව සාධාරණව ලැබීම. (පිටු අංක 16)

(vi) ★ ජාතික ඒකාග්‍රතාව
★ යුධ හා නාවික ශක්තිය
★ දියුණු ආර්ථික තත්ත්වය
★ ජාතීන් සතු වූ නිර්මාණශීලී හැකියාව (පිටු අංක 18)

(vii) නීතිය හා සදාචාරය (පිටු අංක 24)

(viii) අමාත්‍යාංශ ලේකම්, දිස්ත්‍රික් ලේකම් (පිටු අංක 35)

(ix) ★ පළාත් සභාව කැඳවීම.
★ වාර අවසාන කිරීම.
★ පළාත් සභාව ඇමතීම හා සංදේශ යැවීම.
★ පළාත් සභා ප්‍රඥප්තීන් අනුමත කිරීම. (පිටු අංක 48)

(x)

| | A | B |
|---|---|---|
| ★ | මූල්‍ය කටයුතු | අධ්‍යාපන |
| ★ | ජාතික ආරක්ෂාව | සෞඛ්‍ය |

(පිටු අංක 54)

02. (i) ★ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය
★ වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය (නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය)

(ii) ★ නිතර රැස්වීම හා සාකච්ඡා කිරීම.
★ සමගිව රැස්වීම, සමගිව සාකච්ඡා කිරීම හා සමගිව විසිර යාම.
★ නොපැන වූ නීති නොපැනවීම, පැනවූ නීති නොපිරිහෙලා ක්‍රියාත්මක කිරීම, ඒවා පිළිපැදීම.
(පිටු අංක 3)

(iii) ★ මහජන කැමත්ත සිදුවන නිසා පාලනයන් තෝරා ගන්නේ මහජනතාවගේ බහුතර කැමැත්ත මතය.
★ ආණ්ඩු බලය හිමි වන්නේ ජනතා ඡන්දයෙන් වැඩිම නියෝජිත පිරිසක් තේරී පත් වූ පක්ෂයට හෝ කණ්ඩායමටය.
★ නීති සම්පාදනය කරනු ලබන්නේ ද මහජන ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ගේ බහුතර කැමත්ත අනුවය.

03. (i) භූමිය, ජනගහනය (පිටු අංක 8)

(ii) බහු පක්ෂ, ඒක පක්ෂ, ද්වි පක්ෂ (පිටු අංක 7)

(iii) ★ සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩුව හා පාලකයන් තෝරා ගැනීම.
★ තරගකාරී පක්ෂ ක්‍රමය
★ ඡන්ද කොට්ඨාශ ක්‍රමය (පිටු අංක 6 - 16)

04. (i) කිසිදු අභ්‍යන්තර හෝ බාහිර බලවේගයක් මැදිහත් වීමෙන් තොරව යෙදිය හැකි අධිකාරී බලයක්
(පිටු අංක 17)

(ii) ★ එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම.
★ භූමිය ජනගහනය ස්වාධිපත්‍ය බලය යන අංගයන්ගෙන් සමන්විත වීම.
★ වෘත්තීය නිලබල පැලන්තියක් මඟින් පාලන බලය මෙහෙය වීම. (පිටු අංක 17)

(iii) (පිටු අංක 35 - 41)

05. (i) ★ විධායක ජනාධිපති විසින් විධායක බලතල ක්‍රියාත්මක කිරීම.
★ ව්‍යවස්ථාදායකය වන කොංග්‍රස් මණ්ඩලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව යන ආයතන දෙකකින් සමන්විත වීම. (පිටු අංක 53)

(ii) ★ ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.
★ ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය.
★ ඉහළ අධිකරණයකට පැවරීම.
★ ඉහළ මන්ත්‍රන සභාවක් පැවතීම. (පිටු අංක 38)

(iii) ★ නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
★ ආර්ථික හා දේශපාලන ස්ථාවරභාවය පවත්වා ගෙන යාම.
★ සමාජ සුභ සාධන සේවා සැපයීම. (පිටු අංක 19)

06. (i) ★ පිහිටීම, සංක්‍රමණ, ආක්‍රමණ
★ විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිණීම.

(ii) ★ විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරණ, විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත් වීම.
★ ඒක ජන කොටසක වුවද ප්‍රාදේශීයව විවිධත්වයක් පැවතීම.
★ විවිධත්වය නිසා ඇති වී තිබෙන ඒ ඒ සංස්කෘතික තත්ත්ව ආවේනික සිරිත් විරිත්, ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම.

(iii) ★ දැනුම ඇදැහිලි තුළ සිරිත් විරිත් නීති ඇගයීම හා මිනිසා විසින් සමාජයේ ජීවත්වන පුද්ගලයකු වශයෙන් ලබාගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියවන්ගේ සමස්ථය.

(ටී. ජී. ටයිගර්)

(සංස්කෘතියට අයත් අංග ලක්ෂණ ඇතුළත් පිළිතුරට ලකුණු ලබා දෙන්න.) (පිටු අංක 57 - 58)

07. (i) සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, ශ්‍රී ලංකා යෝනක

(ii)
- ★ රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාවය.
- ★ රාජ්‍ය සේවය දේශපාලනීකරණය.
- ★ නිළධාරීවාදය
- ★ අල්ලස හා දූෂණය ඉහළ යාම. (පිටු අංක 63)

(iii)
- ★ අන්‍ය ආගම් වලට අවමාන නොකිරීම.
- ★ අන්‍ය සංස්කෘතිකයන්ට ගරු නොකිරීම.
- ★ ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.
- ★ සාමුහිකත්වය වර්ධනය කිරීම.
- ★ අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම.

***

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඔඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

